**සීමාසහිත මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම - 2017**

---

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ(පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කලයුතු යයි මා අදහස් කරනු ලබන සමාගමේ කාර්යසාධනය පිළිබඳ මගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
------------------

### 2.1 මතය
--------

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව
--------------------------------------------------------------------

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163(2) වගන්තියෙහි අවශ්‍යතාවය ප්‍රකාරව මම පහත කරුණු දක්වා සිටි.

මෙම මතය සඳහා පදනම, විගණනයට අදාල විෂය පථය සහ සීමාවන් ඉහත දක්වා ඇති පරිදි වේ. මාගේ මතයේදී

- විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයේදී පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් ඇති බව.
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල බව

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණවලට අනුකූල නොවීම
----------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක PED 03/2016 | සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් අධ්‍යක්ෂක මණ්ඩලයේ දීමනා අඩු කර නොගෙන රු. 1,820,645 ක මුදලක් උපයන විට ගෙවීම් බදු වශයෙන් ගෙවා තිබුණි. |
| (ආ) 2015 මැයි 18 දිනැති අංක PE/IN/SLIC/Gen/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර ලිපිය | භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා නොගෙන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අප්‍රේල් සහ දෙසැම්බර් යන මාස සඳහා ප්‍රසාද දීමනා හා තෑගි වවුචර් සඳහා පිලිවෙලින් රු. 1,343,268, රු. 1,142,435 සහ රු. 45,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය සඳහා ගෙවා තිබුණි. |
| (ඇ) 1971 අංක 24 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරණ සේවක භාර අරමුදල් පනත | උපදේශකවරයා වෙත කරනු ලැබූ ගෙවීම් සම්බන්ධයෙන් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා සේව්‍ය සහ සේවක දායකත්වය ගෙවා නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයක් නොමැති ගනුදෙනු**

----------------------------------------------------------

මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා නොගෙන සමාගමේ සේවකයින් වෙත ලෙඩ නිවාඩු මුදලින් ලබා ගැනීම් සහ දීර්ඝ සේවා කාලයට ගෙවීම් පිලිවෙලින් රු. 8,754,281 සහ රු. 570,000 ක් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

-------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-----------------

සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගම සමඟ ඇති කරගන්නා ලද ගිවිසුම හේතුවෙන් ශුද්ධ පොදු කාර්යය පිරිවැය නැවත ආපසු ලබා ගැනීම නිසා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය ලාභයක් පාඩුවක් නොවීය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

**4.1 කාර්ය සාධනය**

--------------------

**4.1.1 මෙහෙයුම් සහ සමාලෝචනය**

-------------------------------------

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ පෞද්ගලික සමාගම සංස්ථාගත කිරීමේ ප්‍රධාන පරමාර්ථය වූයේ සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගමේ ඉහලම මට්ටමේ කලමනාකරණය (අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක ශ්‍රේණියේ කාර්ය මණ්ඩලය) සඳහා වේතන සහ අනෙකුත් මූල්‍යමය දීමනා සැකසීමය. කෙසේ වෙතත් එම කාර්යය පෞද්ගලික සමාගමකට (out sourced) බාර දී තිබුණි. එම්.එස්.ආර්.පී.එල්. සඳහා සේවකයින් අනුයුක්ත කර නොතිබූ අතර ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගමේ සේවකයින් දෙදෙනෙක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගම සහ එම්.එස්.එල්. සිස්ටම් පුද්ගලික සමාගම සම්බන්ධීකරණය කර තිබුණි. 2017 වර්ෂයේදී වේතන සැකසීමේ වියදම වශයෙන් රු.761,174 ක වියදමක් ගෙවා තිබුණි.

**4.2 කලමනාකරණ ක්‍රියාකාරකම්**

------------------------------------

විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරන ලදී.

(අ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ සටහන් යටතේ සමාගමේ බදු සම්බන්ධ විස්තරවල අවම වශයෙන් හෙළිදරවු කල යුතු අවම අවශ්‍යතා හෙළිදරව් කිරීමට සමාගමේ කලමනාකරණය විසින් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීමට අනුව රු. 1,551,544 ක මුදලක් 2016/2017 තක්සේරු වර්ෂයෙන් ලැබිය යුතු වශයෙන් ඉදිරියට ගෙනැවිත් තිබුණද ලැබිය යුතු ශේෂයක් 2016 මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව 2016/2017 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වියදම් රු. 1,132,506 ක් වුවද ගණනය කිරීම් අනුව එය රු. 317,102 ක් විය. ඒ අනුව රු. 815,404 ක වැඩි වෙන් කිරීමක් මූල්‍ය ප්‍රකාශනයන්හී දක්වා තිබුණි. කෙසේ වෙතත් අදාල මුදල් වර්ෂය තුලදී එම ප්‍රමාණය ප්‍රතිවර්තනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) බදු වගකීම ගණනය කරන අවස්ථාවේදී රු. 509,780 ක උපයන විට ගෙවීම් වියදමක් වශයෙන් සලකා තිබුණි. එබැවින් වර්ෂය සඳහා වූ බදු වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2017 මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පිළිවෙලින් රු. 14,146,326 ක් සහ රු. 32,052 ක් වන ගෙවිය යුතු සහ ලැබිය යුතු එකතු කල අගය මත බදු මුදල් සම්බන්ධ විස්තරාත්මක උපලේඛණ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2014/2015 වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු වශයෙන් රු. 1,896,273 ක මුදලක් 2017 දෙසැම්බර් 31 වන දින ගෙවිය යුතු ආදායම් බදු ගිණුමට හර කර තිබුණි.

(උ) සමාගමේ විමර්ශන අංශය සඳහා 2017 පෙබරවාරි 06 දින සිට 2017 මැයි 05 දින දක්වා මාස 03 ක කාලයක් සඳහා සමාගමේ විශ්‍රාම ගිය කලමනාකරුවෙකු උපදේශකයෙකු වශයෙන් බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත් එම බඳවා ගැනීම සඳහා ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගත හැකි සාක්ෂි පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කර නොතිබුණි. එසේම එම නිලධාරියාගේ සේවා කාලය ජුලි මස සිට 2017 දෙසැම්බර් මස දක්වා දීර්ඝ කර තිබුණි. එනමුත් එම කාල සීමාව දීර්ඝ කිරීම සඳහා ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර එම නිලධාරියාට දෙසැම්බර් මසදී රු. 312,000 ක ප්‍රසාද දීමනා මුදලක් ගෙවා තිබුණි.

(ඌ) ප්‍රතිපත්තියක් වශයෙන් සමාගමේ බඳවා ගැනීම් සිදු කර ඇත්තේ පිළිගත් බඳවා ගැනීමේ නියෝජිත ආයතනයක් හරහාය. එසේ වුවත් ජ්‍යෙෂ්ඨ මානව සම්පත් කලමනාකරු, ප්‍රධාන නිලධාරී සාමාන්‍ය රක්ෂණය සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරුවලට බඳවා ගැනීම සඳහා 2017 වර්ෂයේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව බඳවා ගැනීමේ ආයතනයක් තෝරාගෙන තිබුණු අතර වෘත්තීමය ගාස්තු, බදු සහ අනෙකුත් වියදම් වශයෙන් රු. 1,780,028 ක මුදලක් ගෙවා තිබුණි.

(එ) ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගමේ විධායක නිලධාරීන්ට ලබා දෙන ඉන්ධන සහ දුරකතන දීමනා, උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඒ) 2014 වර්ෂයට අදාල ජාතිය ගොඩනැගීමේ බදු අදාල කාලය තුලදී නොගෙවීම හේතුවෙන් ප්‍රමාද දඩ මුදල් වශයෙන් රු. 93,806 ක මුදලක් ගෙවීමට සිදු වි තිබුණි.